සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2022-08-27
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) ***ප්‍රස්තාර කොළ** සපයනු ලැබේ.*
  - (7) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (8) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක **1.1** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික නොවන සම්පතක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ආහාර. (2) වාසස්ථාන. (3) ගොඩනැගිල්ල. (4) හිරු එළිය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමට හේතුවක් **නොවන්නේ** කුමක් ද?

(1) ආදේශක භාණ්ඩවල මිල ඉහළ යාම.

(2) පාරිභෝගික ආදායම පහළ යාම.

(3) අනාගතයේදී භාණ්ඩයේ මිල අඩු වෙතැයි අපේක්ෂා කිරීම.

(4) අනුපූරක භාණ්ඩවල මිල ඉහළ යාම.

**1.3** කිසියම් භාණ්ඩයක මිල රු.10/- සිට රු.12/- දක්වා ඉහළ යනවිට එම භාණ්ඩයට ඇති ඉල්ලුම් ප්‍රමාණය වෙනස් නොවේ. එම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය:

(1) පූර්ණ අනම්‍ය වේ. (2) සාපේක්ෂ නම්‍ය වේ.

(3) ඒකීය නම්‍ය වේ. (4) පූර්ණ නම්‍ය වේ.

**1.4** කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අදාලව නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) ස්ථාවර සාධක යෙදවුම් නොමැත.

(2) ස්ථාවර සාධක යෙදවුම් සහ විචල්‍ය සාධක යෙදවුම් යන දෙවර්ගයම භාවිත කෙරේ.

(3) සියලුම සාධක යෙදවුම්, ස්ථාවර සාධක යෙදවුම් බවට පත්වේ.

(4) විචල්‍ය සාධක යෙදවුම් වෙනස් නොවේ.

**1.5** 2021 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූයේ:

(1) ඇමරිකානු ඩොලර් ($) 3,604. (2) ඇමරිකානු ඩොලර් ($) 3,815.

(3) ඇමරිකානු ඩොලර් ($) 4,082. (4) ඇමරිකානු ඩොලර් ($) 3,945.

**1.6** යෙදවුම් වැඩි කිරීමට සමානුපාතිකව අඩු ප්‍රමාණයකින් මුළු නිමැවුම වැඩි වන්නේ නම්, ආයතනය අත්විඳිනු ලබන්නේ:

(1) වැඩිවන පරිමාණුකූල ඵලයි. (2) අඩුවන පරිමාණුකූල ඵලයි.

(3) හීනවන ආන්තික ඵලයි. (4) ස්ථාවර පරිමාණුකූල ඵලයි.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ඒකාධිකාරී තරඟයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) අබාධ පිවිසුම සහ පිටවීම. (2) නිෂ්පාදන සාධකවල පූර්ණ සංචලතාවය.

(3) සමජාතීය භාණ්ඩ තිබීම. (4) දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ ලැබීම.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, සූක්ෂම ආර්ථික විද්‍යාව යටතේ ආවරණය වන ක්ෂේත්‍රයක් වන්නේ කුමක් ද?

(1) සමාහාර නිමැවුම. (2) මිල මට්ටම.

(3) පාරිභෝගිකයන්ගේ හැසිරීම. (4) සේවා නියුක්තිය.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට ඇතුළත් **නොවන්නේ** කුමක් ද?

(1) මහජනයා සතු ව්‍යවහාර මුදල්.

(2) මහජනතාව සතු ඉල්ලුම් තැන්පතු.

(3) දේශීය බැංකු ඒකකවල ඇති මහජනතාව සතු කාලීන සහ ඉතුරුම් තැන්පතු.

(4) බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ඇති කාලීන සහ ඉතුරුම් තැන්පතු.

**1.10** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) මුළු උපයෝගිතාවය සහ ආන්තික උපයෝගිතාවය මැනිය නොහැකිය.

(2) භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් පුද්ගලයෙකු ලබන අතිරේක තෘප්තිය, මුළු උපයෝගිතාවය වේ.

(3) මුළු උපයෝගිතාවය වැඩිවන විට, ආන්තික උපයෝගිතාවය සෘණ අගයක් ගනී.

(4) මුළු උපයෝගිතාවය උපරිම වන විට, ආන්තික උපයෝගිතාවය ශුන්‍ය වේ.

*අංක **1.11** සහ **1.12** ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.11** ……………… (*වෙළෙඳපොළ / සැලසුම්ගත*) ආර්ථික ක්‍රමයක් තුළ, සම්පත්වල හිමිකාරිත්වය රජය සතුවේ.

**1.12** ……………… *(සාමාන්‍ය නිෂ්පාදනය / ආන්තික නිෂ්පාදනය)* ශුන්‍ය වන විට, මුළු නිෂ්පාදනය උපරිම වේ.

*අංක **1.13** සහ **1.14** ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.13** උපේක්ෂා වක්‍ර දෙකක් එකිනෙක හරහා ඡේදනය වේ.

**1.14** කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී, සාමාන්‍ය පිරිවැය වක්‍රයේ (Average Cost Curve) අවම ලක්ෂයේදී, ආන්තික පිරිවැය [Marginal Cost (MC)], සාමාන්‍ය පිරිවැයට [Average Cost (AC)] සමාන වේ.

*අංක **1.15** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.15** නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනයේ ඇති ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.16** රජයේ හිඟ අයවැයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.17** රජය විසින් මිල පාලන පැනවීම සඳහා ඇති හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.18** මුදලට ඇති ඉල්ලුම තීරණය කරන හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** මුළු නිෂ්පාදිතය [Total Product (TP)] සහ සාමාන්‍ය නිෂ්පාදිතය [Average Product (AP)] අතර වෙනස සඳහන් කරන්න.

**1.20** මානව සංවර්ධන පැතිකඩය තුළ ඇතුළත් අයිතම දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) "ආවස්ථික පිරිවැය" යන පදය සුදුසු උදාහරණයක් සමගින් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) මිශ්‍ර ආර්ථික ක්‍රමයක් මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳනු ලබන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ඒකාධිකාරී වෙළෙඳපොළක (monopoly market) ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) **A නිෂ්පාදිතයට** අදාලව ඉල්ලුම් සමීකරණය (Qd) සහ සැපයුම් සමීකරණය (Qs) පහත සඳහන් පරිදි වේ:

$$Qd = 1,600 - 5p$$

$$Qs = -800 + 3p$$

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

**A නිෂ්පාදිතයට** අදාලව පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) සමතුලිත මිල සහ ප්‍රමාණය. (ලකුණු 04)

(ii) පාරිභෝගික අතිරික්තය. (ලකුණු 02)

(b) රජය විසින් භාණ්ඩයක් මත සමතුලිත මිලට වඩා වැඩියෙන් අවම මිලක් පැනවීමේ ප්‍රතිවිපාක **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) "ශ්‍රී ලංකාව මුහුණ දී සිටින වත්මන් ආර්ථික අර්බුදකාරී තත්ත්වය මගහරවා ගැනීම සඳහා සිය මුල්‍ය ප්‍රතිපත්තිය දැඩි කරන ලෙස ජාත්‍යන්තර මුල්‍ය අරමුදල [International Monitory Fund (IMF)] ශ්‍රී ලංකාවට යෝජනා කරයි."

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීම / අඩු කිරීම සඳහා මුල්‍ය ප්‍රතිපත්තිය බලපානු ලබන ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) **X** සහ **Y** යන රටවල් දෙක, සහල් සහ තිරිඟු යන නිෂ්පාදිත දෙකම නිෂ්පාදනය කරයි. මෙම රටවල් දෙක මගින් එක් ශ්‍රම ඒකකයකින් නිපදවනු ලබන සහල් සහ තිරිඟු ඒකක ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| නිෂ්පාදිතය / රට | සහල් (කිලෝ ග්‍රෑම්) | තිරිඟු (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| X | 6 | 3 |
| Y | 2 | 4 |

එක් එක් නිෂ්පාදිතය නිපදවීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටකට ද යන්න **පැහැදිලි කරන්න** *(ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(b) එක්සත් ජනපද ඩොලරයට (US Dollar) සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල මෑතකදී අවප්‍රමාණය වීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) ජාත්‍යන්තර වෙළඳාමේ ඇති වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) වසරක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාලව පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබා දී ඇත:

| | රු. මිලියන |
|---|---|
| සේවක ආදායම | 1,000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 1,400 |
| මිශ්‍ර ආදායම් | 1,200 |
| නිෂ්පාදනය මත සහනාධාර අඩුකළ පසු වෙනත් බදු | 750 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම | 1,500 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් | 1,200 |
| නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු | 500 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ආදායම් ප්‍රවේශය (Income Approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) මූලික මිලට දළ එකතු කළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 05)

(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 03)

(b) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(B) සාර්ව ආර්ථික අරමුණු (Macro-Economic Objectives) ලෙස සාධාරණ ආදායම් බෙදියාම සහ පූර්ණ සේවා නියුක්තිය අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(C) රටක ආර්ථික වර්ධනය තීරණය කරන සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව නිරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය නිරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |